# ඔබේ පරිගණක තිරයට අලංකාර දින දර්ශනයක්




**ඔබේ පරිගණක තිරය දැනටමත් විවිධ ජායරූප (Wall paper) මගින් අලංකාර කරගෙන ඇතැයි සිතමි. මේ සඳහා බොහෝ දෙනා උපයෝගී කර ගන්නේ මෙහෙයුම් පද්ධතිය සමග එන සම්මත ජායාරූප හා සුරැකුම් (Screen Saver)ය. සම්මතයෙන් මිදී නව ආරකට තිර සුරැකුම් ක්‍රියාත්මක කිරීමටත් අතිශය අලංකාර දර්ශන වලින් හෙබි Wallpaper වලින් හා තිරයමත දර්ශනය වන දින දර්ශනයකින් ඔබේ පරිගණක තිරය අලංකාර කර ගැනීමට ඔබ කැමතිද ?**

අන්තර් ජාල පහසුවක් නැති අයටද මෙම මෘදුකාංගය භාවිත කළ හැකියි. ඒ අන්තර් ජාලය ඇති අයකුගේ පරිගණකයකට මෙම මෘදුකාංගය තැන්පත් කර නම්‍ය තැටි යක ආධාරයෙන් ඔබේ පරිගණකයේ තැන්පත් කිරීමෙනි. නමුත් ඔබට අන්තර්ජාල පහසුකම් තිබේ නම් දහස් ගණනක් වු විවිධ ජායාරූප හා තිර දුරැකුම් නොමිලේම පරිගණකයට භාගත කර ගත හැකියි. එමෙන්ම දිනපතාම අලුත්ම ජායාරූප ස්වයංක්‍රීයවම ඔබේ පරිගණකයට ඇතුළු කිරීමේ පහසුකම්ද මෙම "Webshosts" තුළ ඇත.

අන්තර්ජාලය හරහා නොමිලේම ලබාගත හැකි කුඩා මෘදුකාංගයකින් මේ සියල්ලක්ම කළ හැකියි. ඒ "Webhosts" නම් කුඩා මෘදුකාංගයයි.

අන්තර් ජාල පහසුවක් නැති අයටද මෙම මෘදුකාංගය භාවිත කළ හැකියි. ඒ අන්තර් ජාලය ඇති අයකුගේ පරිගණකයකට මෙම මෘදුකාංගය තැන්පත් කර නම්‍ය තැටි (Floppy) යක ආධාරයෙන් ඔබේ පරිගණකයේ තැන්පත් කිරීමෙනි. නමුත් ඔබට අන්තර්ජාල පහසුකම් තිබේ නම් දහස් ගණනක් වු විවිධ ජායාරුප හා තිර දූරැකුම් නොමිලේම පරිගණකයට භාගත (Download) කර ගත හැකියි. එමෙන්ම දිනපතාම අලුත්ම ජායාරූප ස්වයංක්‍රීයවම ඔබේ පරිගණකයට ඇතුළු කිරීමේ පහසුකම්ද මෙම "Webshosts" තුළ ඇත.

මුලින්ම ඔබ W W W Webshosts. Com වෙබ් අඩවියට පිවිසෙන්න. ඉන් පසු ඉතා සරල ක්‍රියාදමයක් තුළින් මෙම මෘදුකාංගය ඔබේ පරිගණකයට භාගත කරගන්න. මෙහිදී අවශ්‍යනම් එහි ඇති සම්මත ජායාරූපවලට අමතරව දැනට ඇති සියලුම ජායාරූප එම මොහොතේම භාගත කර ගත හැකි මුත් ඒ සඳහා යම් කාලයක් යන බැවින් පසු වෙලාවක දී එවැනි ජායාරූප පරිගණකයට ඇතුළු කිරීමේ පහසුකම "Webshosts" තුළ ඇත.

මෙම මෘදුකාංගය පරිගණකයට ඇතුළු කළ පසු තිරයේ පහළ දකුණු පස webshosts අයිකනය දක්නට ලැබේ. මවුසිය ආධාරයෙන් මෙම අයිකනය Right Click කළ විට ඇති Setting යන්න සක්‍රිය කරීමෙන් අංක 1 රූපයේ පරිදි මුහුණතක් දිස්වේ. මෙහි Wallpaper හ මුලින්ම ඇති කුඩා කොටු දෙක සක්‍රිය කරන්න. එමෙන්ම පරිගණක තිරයෙහි ඇති ජායාරුප වෙනස්විය යුත්තේ කුමන කාලයකදී ද බව සැකසීමට Automaticaly ගලා හැලෙන මෙනුවෙන් අවශ්‍ය දෙය තෝරාගන්න.

පරිගණක තිරයෙහි දින දර්ශනයක් දිස්වීමට සැලැස්වීමට නම් මෙහි ඇති Calender යන්න සක්‍රිය කරන්න.




1




2

මෙහිදී ද පහතින් ඇති කුඩා කොටු දෙක සක්‍රිය කරන්න. දින දර්ශනයේ අකුරුවල ප්‍රමාණය සැකසීමට නම් Text Size යන්නෙන් අවශ්‍ය ප්‍රමාණයද සතිය ආරම්භවිය යුත්තේ කුමන දවසකින්ද යන්න Week on යන්නෙන් ද, පසුගිය මාස හය මෙන්ම ඉදිරියට ඇති මාස හයද දර්ශනය වීමට අවශ්‍ය නම් "Past හා



3

Future Months මගින් අවශ්‍ය තේරීම් කරන්න.

මෙහි අඩංගු වී ඇති ඡායාරූප ආධාරයෙන් අලංකාර තිර සුරැකුම් සාදගැනීමටද හැකියි. මේ සඳහා Screen Saver සක්‍රිය කර එහි ඇති විවිධ තේරීම් සක්‍රිය කර හෝ අක්‍රිය කර අත්හදා බලන්න.

මෙම තිර සුරැකුම් ක්‍රියාත්මක වීමේ දී මෙන්ම Wall papr වල ඇති ඡායාරූප එකිනෙක මාරුවීමේ දී ඒවා අලංකාර ලෙස මිශ්‍ර කිරීමට ද මෙම මෘදුකාංගය මගින් කළ හැකියි. ඒ සඳහා Effects වෙත ගොස් එහි ඇති සියල්ලම සක්‍රිය කර බලන්න. එවිට එහි මිශ්‍ර වීම් විවිධාකාරයෙන් අලංකාරව සිදුවන නිසා ඔබේ පරිගණක තිරයට අලංකාරයක් ගෙනදේ.

මෙහි ඇති විවිධ උපයෝගිතාවන් වෙනස් කර අත්හදා බලන්න. මෙමගින් ඔබේ පරිගණකයට හෝ මෙම මෘදුකාංගයට කිසිදු හානියක් නොවේ.



4

මෙසේ සියලු වෙනස්කම් කළ පසු OK කිරීමෙන් (05) රූපයේ පරිදි Webshosts Home Page එක දිස්වේ. මෙහි දකුණුපස දැනට ගබඩා වී ඇති සියලුම ඡායාරූප කුඩාවට දිස්වේ.

මෙහි ඇති ඔබ කැමති ඡායාරූපයක් ඔබේ පරිගණක තිරයට එක් කළ හැකියි. ඒ සඳහා ඔබ කළ යුත්තේ අදාළ ඡායාරූප Double Click කිරීම පමණයි.



5

එමෙන්ම මෙයට ඔබ කැමති දැනට දෘඩ තැටියේ හෝ සංගත තැටි CD වල ඇති ඕනෑම ඡායාරූපයක් එක්කළ හැකියි. මේ සඳහා Webshosts තුළ ඇති ඡායාරූපයක් මතට මවුස් පොයින්ටරය ගෙන ගොස් Right Click කර ලැබෙන අකුරු මෙනුමෙන් Add New යන්න තෝරාගන්න. (6 රූපය) දෘඩ තැටියේ හෝ සංගත තැටියේ ඇති ඔබට අවශ්‍ය ඡායාරූපය තෝරා Open කරන්න. එවිට එම ඡායාරූපය Webshosts තුළ ස්වයංක්‍රියව තැන්පත් වේ.


6

ඔබ කැමති ඕනෑම ඡායාරූප සංඛ්‍යාවක් මේ අයුරින් Webshosts තුළට ඇතුළු කළ හැකියි.

අංක (7) රූපයෙන් දක්වා ඇත්තේ එසේ පිටතින් එක් කළ ඡායාරූපයක් හා දින දර්ශනයකින්ද සමන්විත පරිගණක තිරයකි. දැන් ඔබ Webshosts වෙතින් ඉවත්වන්න. මෙතෙක් ඔබේ පරිගණක තිරයට වැළඳී තිබූ ඇලි මැලි ගතිය ඉවත් වී අලංකාර ලෙස හැඩ ගැන්වී ඇති අයුරු නරඹන්න.

**මොහාන්**



7